**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 23.01.2023 |

01. ලේකම්
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

02. සභාපති
ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව

**<u>අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය පැවැත්වෙන කාල කාලසීමාව තුළ විදුලි සැපයුම බාධාවකින් තොරව ලබාදීම සම්බන්ධවයි</u>**

2022 වසරට අදාළව අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා අපේක්ෂකයින් 331709 දෙනෙකු සහභාගී වන බවත්, මෙම විභාගය 2023 ජනවාරි මස 23 දින සිට 2023 පෙබරවාරි මස 17 වන දින දක්වා පැවැත්වෙන බවත් 2023 ජනවාරි මස 23 වැනි දින ලංකාදීප පුවත්පතේ විභාග කොමසාරිස් ජනරාල්වරයා උපුටා දක්වමින් පළ කර ඇත.

මෙම විභාගය සඳහා පෙනී සිටින දරුවන්ට දිවයින් පුරා පැය 02 විනාඩි 20ක කාලයයක් විදුලිය විසන්ධි කිරීම නිසා විභාගයට සූදානම් වීම නිසි පරිදි සිදු කිරීමට නොහැකි තත්ත්වයක් උද්ගතවී ඇති අකර, එම තත්ත්වය ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාමට බාධාකාරී තත්ත්වයක් ඇති කර ඇත. එමඟින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව මගින් සලසා ඇති සමානාත්මතාව පිළිබඳ මූලධර්මය දරුවන්ට අහිමි වූ බව ශ්‍රී ලංකා මානව හිමිකම් සභාව නිරීක්ෂණය කරනු ලැබේ.

දැනට ක්‍රියාත්මක වන විදුලි කප්පාදුව ඔස්සේ ඔවුන්ගේ අධ්‍යාපන අයිතියට බාධාකාරි තත්වයක් ඇති වී ඇති බවක් නිරීක්ෂණය වන බැවින් අධ්‍යයන පොදු සහතික උසස් පෙළ විභාගය පැවැත්වෙන 2023 ජනවාරි මස 23 වන දින සිට පෙබරවාරි මස 17 දින දක්වා විදුලි විසන්ධි කිරීම් වළක්වාලීමට අවශ්‍ය සුදුසු පියවර ගන්නා ලෙස මෙමගින් ඔබ ආයතන වෙත ශ්‍රී ලංකා මානව මානව හිමිකම් සභාව දන්වා සිටිමු.

විනිසුරු රෝහිණී මාරසිංහ
සභාපතිනි
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව


| | | | | | |
|---|---|---|---|---|---|
| **ප්‍රධාන කාර්යාලය**<br>பிரதான அலுவலகம்<br>Head Office | **14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.**<br>14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.<br>14, R. A. De Mel Mawatha, Colombo - 04. | **සභාපති**<br>தவிசாளர்<br>Chairperson | 011-2505451 | **ෆැක්ස්**<br>தொலைநகல்<br>Fax | 011-2505541 / 74 |
| **ඊමේල්**<br>மின்னஞ்சல்<br>E-mail | sechrc@gmail.com | | | | |